www.agaram.lk

OL/2015/81-S-I-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**81 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2015**

| | | |
|---|---|---|
| **කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය** | **I, II** | **පැය තුනයි** |
| விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் | **I, II** | மூன்று மணித்தியாலம் |
| Agriculture and Food Technology | **I, II** | *Three hours* |

## කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** පහත සඳහන් බෝග අතරින් ශ්‍රී ලංකාවේ වැඩි ම බිම් ප්‍රමාණයක වගා කර ඇති බෝගය,
(1) තේ ය. (2) පොල් ය. (3) රබර් ය. (4) වී ය.

**2.** පුද්ගලයන් කරන කාර්යය අනුව ඔවුන්ගේ පෝෂණ අවශ්‍යතා වෙනස් වේ. පහත සඳහන් පුද්ගලයන් අතරින් ශක්තිජනක ආහාර වැඩි ම ප්‍රමාණයක් අවශ්‍ය වන්නේ,
(1) පාසල් යන අවධියේ ළමයින්ට ය. (2) බර වැඩ කරන පිරිමින්ට ය.
(3) කිරි දෙන මව්වරුන්ට ය. (4) තරුණ කාන්තාවන්ට ය.

**3.** පුරාණ රජ දවස ශ්‍රී ලංකාව ආහාරවලින් ස්වයංපෝෂිතව පැවැතීමට ප්‍රධාන හේතුව වූයේ,
(1) උසස් වාරි තාක්ෂණයක් යොදා ගැනීම ය.
(2) දෙමුහුම් බෝග වර්ග වගා කිරීම ය.
(3) රෝග පළිබෝධවලට ප්‍රතිරෝධී බෝග ප්‍රභේද නිපද වීම ය.
(4) රසායනික පොහොර භාවිතයෙන් තොර බෝග වගා කිරීම ය.

**4.** ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ දී වැව්වලින් ඉටුවන කාර්යය ඉතා වැදගත් ය. වැවක අමතර ජලය වැවෙන් ඉවත් කිරීමට යොදාගනු ලබන ව්‍යුහය,
(1) සළපනාව ය. (2) බිසෝ කොටුව ය. (3) සොරොව්ව ය. (4) පිටවාන ය.

**5.** ගොවි මහතකු වගාවක් ආරම්භ කිරීම පිණිස බීජ තෝරාගෙන ඒවා පැය 12ක් පමණ ජලයේ පොඟවා ක්ෂේත්‍රයේ සිටුවන ලදී. මෙලෙස බීජ ජලයේ පෙඟවීමෙන් බලාපොරොත්තු වූයේ,
(1) රෝග මර්දනයයි. (2) කෘමි මර්දනයයි.
(3) ප්‍රරෝහණය උත්තේජනයයි. (4) නියං ප්‍රතිරෝධීතාව ඇති කිරීමයි.

**6.** වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාව, බෝග වගා කටයුතු කෙරෙහි බලපාන සාධකයකි. වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩි වූ විට දී,
(1) ශාකවල උත්ස්වේදන ශීඝ්‍රතාව වැඩි වේ.
(2) ශාක රෝග හා පළිබෝධ හානි වැඩි වේ.
(3) ශාක මුල්වලින් ජල අවශෝෂණය වැඩිවේ.
(4) ධාන්‍ය අස්වනුවල ගබඩා කාලය වැඩි වේ.

**7.** විවිධ සාධකවල බලපෑම නිසා මාතෘ පාෂාණය ජීර්ණය වී මාතෘ ද්‍රව්‍ය සෑදෙයි. මෙම මාතෘ ද්‍රව්‍ය පාංශු පැතිකඩෙහි කුමන කලාපයේ (ස්තරයේ) දක්නට ලැබේ ද?
(1) A කලාපයේ (2) B කලාපයේ (3) C කලාපයේ (4) O කලාපයේ

**8.** ශිෂ්‍යයෙක් පෝච්චියක මිරිස් පැළයක් සිටුවා එයට වැඩිපුර ජලය යෙදුවේ ය. පෝච්චියෙහි පතුලේ ඇති සිදුරෙන් අතිරික්ත ජලය සියල්ල බැස ගිය පසු එහි ඇති පසෙහි අඩංගු වන්නේ,
(1) කේශාකර්ෂණ ජලය හා ගුරුත්වාකර්ෂණ ජලයයි. (2) ජලාකර්ෂණ ජලය හා ගුරුත්වාකර්ෂණ ජලයයි.
(3) ජලාකර්ෂණ ජලය හා කේශාකර්ෂණ ජලයයි. (4) ජලාකර්ෂණ ජලය පමණි.

[දෙවැනි පිටුව බලන්න.

agaram.lk
Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
68101

www.agaram.lk



**9.** ගොවි මහතකු මාසයක් පමණ වයසැති එළවළු වගාවකට නයිට්‍රජන් අඩංගු පොහොර යොදා ජලසම්පාදනය කළේ ය. ස්වල්ප වේලාවකින් දැඩි වර්ෂාපතනයක් ඇති වූ අතර තමා යෙදූ පොහොර සියල්ල සේදී ගොස් ඇතැයි සිතා ඔහු කනස්සල්ලට පත් විය. නමුත් දින කිහිපයකට පසු වගාව සශ්‍රීක ව වැඩී ඇති බව ගොවියා නිරීක්ෂණය කළේ ය. මේ නිසා තමා යෙදූ පොහොර සියල්ල සේදී ගොස් නැති බව ඔහුට තහවුරු විය. මෙම සංසිද්ධියට හේතුව නම්,

(1) පසෙහි කැටායන හුවමාරුවයි. (2) පාංශු ව්‍යුහයයි.
(3) පාංශු pH අගයයි. (4) පාංශු වයනයයි.

**10.** පරිසර හිතකාමී ගොවිතැනේ දී පළිබෝධ හානි අවම කර ගැනීම සඳහා භාවිත කළ හැකි විකර්ශක ශාක වර්ග නම්,

(1) දඹල හා මුං ය. (2) දාස්පෙතියා හා සූරියකාන්ත ය.
(3) කුඩළු හා ඉක්සෝරා ය. (4) වම්බටු හා බණ්ඩක්කා ය.

**11.** ශිෂ්‍යයකු ඉදුණු තක්කාලි ගෙඩියකින් ලබාගත් බීජ ප්‍රතිකාරයකින් **තොරව** තවාන් කළ නමුත් නියමිත කාලපරාසයේ දී එම බීජ ප්‍රරෝහණය නොවී ය. මීට හේතුව විය හැක්කේ මෙම බීජවල,

(1) ඝන බීජාවරණ තිබීමයි. (2) අපාරගම්‍ය බීජාවරණ තිබීමයි.
(3) නිෂේධක ද්‍රව්‍ය තිබීමයි. (4) කලල අක්‍රියව පැවතීමයි.

**12.** පෙට්‍රි දීසි ක්‍රමයට බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය සෙවීමේ පරීක්ෂණයක් සඳහා බීජ 80ක් යොදා ගන්නා ලදී. එයින් බීජ 60ක් ප්‍රරෝහණය විය. මෙම බීජ නියැදියේ ප්‍රරෝහණ ප්‍රතිශතය,

(1) 45% කි. (2) 60% කි. (3) 75% කි. (4) 85% කි.

**13.** ශාක බද්ධයක් සඳහා අනුජය තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

A - උසස් ගුණාත්මක බවින් යුතු මව් ශාකයකින් ලබාගත යුතු ය.
B - ග්‍රාහක ශාකය අයත් කුලයේ ම ශාකයකින් ලබාගත යුතු ය.
C - ශක්තිමත් මූල පද්ධතියක් සහිත ශාකයකින් ලබාගත යුතු ය.

මෙයින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C සියල්ලම ය.

**14.** බිම් සැකසීමේ උපකරණ පිළිබඳ විස්තර අඩංගු වගුවක් පහත දැක්වේ.

| | ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණය | ද්විතීයික බිම් සැකසීමේ උපකරණය | අතුරුයත් ගෑමේ උපකරණය |
|---|---|---|---|
| A | උදැල්ල | තුන් පුරුක් කල්ටිවේටරය | තැටි පෝරුව |
| B | අත් මුල්ලුව | තැටි නගුල | ජපන් රොටරි වීඩරය |
| C | පා මුල්ලුව | තැටි පෝරුව | චොපිං හෝව |
| D | තැටි නගුල | හැඩි ලැලි නගුල | තැටි පෝරුව |

ඉහත වගුවෙහි බිම් සැකසීමේ අවස්ථා අනුව, උපකරණ සියල්ල ම නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති පේළිය නම්,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**15.** බෝග අස්වනු නිසි ලෙස සකසා වෙළෙඳපොළට යැවීමෙන් අස්වනු අපතේ යාම අඩුවන නිසා ගොවියාට වැඩි ආදායමක් ලබාගත හැකි වේ. කෘෂි අස්වැන්න ගොවිබිමේ සිට වෙළෙඳපොළ දක්වා යැවීමේ ක්‍රියාවලියේ පියවරවල නිවැරදි අනුපිළිවෙළ දක්වා ඇති වරණය කුමක් ද?

(1) පිරිසිදු කිරීම හා තේරීම ⟶ ශ්‍රේණිගත කිරීම ⟶ ඇසිරීම ⟶ ප්‍රවාහනය
(2) ශ්‍රේණිගත කිරීම ⟶ පිරිසිදු කිරීම හා තේරීම ⟶ ඇසිරීම ⟶ ප්‍රවාහනය
(3) තේරීම හා ශ්‍රේණිගත කිරීම ⟶ පිරිසිදු කිරීම ⟶ ප්‍රවාහනය ⟶ ඇසිරීම
(4) පිරිසිදු කිරීම ⟶ ප්‍රවාහනය ⟶ ශ්‍රේණිගත කිරීම ⟶ ඇසිරීම

**16.** ද්විතීයික බිම් සකස් කිරීමේ අරමුණු වන්නේ,

(1) පස පෙරළීම හා කැට පොඩි කිරීමයි. (2) කැට පොඩි කිරීම හා මට්ටම් කිරීමයි.
(3) වල්පැළ පාලනය හා කැට පොඩි කිරීමයි. (4) පස පෙරළීම හා වල්පැළ පාලනයයි.

**17.** බද්ධ අඹ පැළ, අර්තාපල් යන බෝග සිටුවීම සඳහා සුදුසු පාත්ති වර්ග පිළිවෙළින්,

(1) උස් පාත්ති සහ ගිල් වූ පාත්ති ය. (2) වැටි හා කාණු පාත්ති සහ ගිල් වූ පාත්ති ය.
(3) ගිල් වූ පාත්ති සහ තනි වගා වලවල් ය. (4) තනි වගා වලවල් සහ වැටි හා කාණු පාත්ති ය.

**18.** ක්ෂේත්‍රයේ සිටුවීමේ දී පැළයේ මුල්වලට සිදුවන හානිය අවම කිරීමේ අරමුණ ඇතිව සකසනු ලබන තවාන් වර්ගය නම්,

(1) මඩ තවාන් ය. (2) ඩැපොග් තවාන් ය.
(3) පාත්ති තවාන් ය. (4) නෙරිදෝකෝ තවාන් ය.

[ තුන්වැනි පිටුව බලන්න

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



Agaram.lk - Keep your dreams alive !

Agaram.lk - Keep your dreams alive !

**19.** සිව් බෝග මාරු ගොවිතැන් ක්‍රමය යටතේ වගා කිරීමට වඩාත් උචිත බෝග අනුපිළිවෙළ දැක්වෙන වරණය කුමක් ද?
(1) මිරිස්, බණ්ඩක්කා, බඩ ඉරිඟු හා කව්පි
(2) බඩ ඉරිඟු, මුං, බතල හා බණ්ඩක්කා
(3) කෙසෙල්, කව්පි, මඤ්ඤොක්කා හා දඹල
(4) පැපොල්, මිරිස්, වැටකොළු හා බඩ ඉරිඟු

**20.** බහු ස්ථර බෝග වගා ක්‍රමයට ගෙවත්තේ බෝග වගා කරන විට නිවසින් ඈත්ව, වැට ආසන්නයේ සිටුවීමට වඩාත් සුදුසු බෝග කාණ්ඩය වන්නේ,
(1) කරාබු, ගම්මිරිස් හා කෙසෙල් ය.
(2) දෙහි, දෙළුම් හා පේර ය.
(3) ගොටුකොළ, වම්බටු හා පැපොල් ය.
(4) කොස්, දූරියන් හා අඹ ය.

**21.** නිර්පාංශු වගාවක් සඳහා රෝපණ මාධ්‍යය ලෙස කොහුබත් යොදා ගැනීමට පෙර ඒවා හුමාලයෙන් තම්බා ගැනීම නිර්දේශ කෙරේ. එයට හේතුව,
(1) ජල වහනය දියුණු කිරීමයි.
(2) වාතනය දියුණු කිරීමයි.
(3) රෝග කාරක විනාශ කිරීමයි.
(4) අහිතකර රසායනික ද්‍රව්‍ය ඉවත් කිරීමයි.

**22.** පළල් පත්‍ර වල්පැළෑටි වර්ග **පමණක්** අඩංගු වරණය කුමක් ද?
(1) විඩේලියා, නිදිකුම්බා හා ජපන්ජබර
(2) ඉළුක්, ගඳපාන හා මොණර කුඩුම්බිය
(3) තුනැස්ස, කලාඳුරු හා මානා
(4) මාරුක්, බජිරි හා පාතිනියම්


**23.** කෙසෙල් ශාකයක පත්‍ර කුඩා වී එකිනෙකට ආසන්නව සැකසී එහි වර්ධනය බාල විය. මෙම තත්ත්වයට හේතු විය හැක්කේ,
(1) බැක්ටීරියා ආසාදනයකි.
(2) වෛරස් ආසාදනයකි.
(3) දිලීර ආසාදනයකි.
(4) වටපනු ආසාදනයකි.

**24.** ශ්‍රී ලංකාවේ, පාංශු ඛාදනයට හේතු වන ප්‍රධාන සාධකය,
(1) මුහුදු රළ ය.
(2) ගලා යන ජලය ය.
(3) වේගවත් සුළඟ ය.
(4) සත්ත්ව ක්‍රියාකාරකම් ය.

**25.** භෞතික භූමි භාවිත වර්ගීකරණයට අනුව ඉතා අධික බෑවුම් සහිත භූමිවල වගා කිරීමට නිර්දේශ කරනු ලබන්නේ,
(1) වැවිලි බෝග ය. (2) ගෝචර තෘණ ය. (3) වන වගා ය. (4) පලතුරු බෝග ය.

**26.** පහත දැක්වෙන පොහොර අතරින් අර්ධ පොහොර මිශ්‍රණයක් වන්නේ,
(1) වී වගාවට යොදන මඩ පොහොර ය.
(2) වී වගාවට යොදන බණ්ඩි පොහොර ය.
(3) ඇලන් කූපර් මිශ්‍රණය ය.
(4) ඇල්බට් මිශ්‍රණය ය.

**27.** මෙම රූපයේ දැක්වෙන ජල සම්පාදන ක්‍රමය නම්,
(1) ඇලි ජල සම්පාදනයයි.
(2) තීරු ජල සම්පාදනයයි.
(3) වළලු ජල සම්පාදනයයි.
(4) බේසම් ජල සම්පාදනයයි.



**28.** ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ඇති ලඳු කැලෑ සහිත බිම්වල අඩු වියදමකින් නිදැලි ක්‍රමයට වඩාත් සාර්ථක ව ඇති කළ හැකි ගොවිපොළ සත්ත්ව වර්ගය නම්,
(1) මී ගවයා ය. (2) එළුවා ය. (3) කුකුළා ය. (4) ඌරා ය.

**29.** පහත සඳහන් වගුවෙහි සත්ත්ව වර්ග, ඔවුන්ට බහුලව ඇති වන රෝග හා ඒවාට අදාළ රෝගකාරක කාණ්ඩ සඳහන් කර ඇත.

| | සත්ත්ව වර්ගය | රෝගය | රෝගකාරක කාණ්ඩය |
|---|---|---|---|
| A | ගවයා | බුරුළු ප්‍රදාහය | දිලීර |
| B | කුකුළා | රැනිකට් | වයිරස් |
| C | ගවයා | කුර හා මුඛ රෝගය | බැක්ටීරියා |
| D | කුකුළා | ඇන්ත්‍රැක්ස් | වයිරස් |

මෙහි නිවැරදි පේළිය නම්,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

agaram.lk

[ හතරවැනි පිටුව බලන්න.

www.agaram.lk



68101

**30.** කිරි ගව දෙනුන් සඳහා දින 60 ක සම්මත වියළි කාලයක් ලබා දීමේ අරමුණු පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - ඉදිරියේ දී ලැබීමට නියමිත පැටවාට අවශ්‍ය පෝෂණය ලබා ගැනීමට ඉඩ සැලසීමයි.
B - ඊළඟ පැටවා ප්‍රසූතිය පහසු කිරීමයි.
C - ගව දෙන දුර්වල වීම වැළැක්වීමයි.
මෙයින් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C සියල්ලම ය.

**31.** මල් පිපීමට ආසන්නව ඇති තෘණ කපා, කොළපාට රැකෙන පරිදි මද පවනේ වියළා සංරක්ෂණය කර නිපදවන ගව ආහාරය,
(1) හේ ය. (2) සයිලේජ් ය. (3) පෝෂ තෘණ ය. (4) ගෝචර තෘණ ය.

**32.** වම්බටු වගාවේ කරල් හා කරටි විදින්නා මර්දනය සඳහා නිර්දේශ කරනුයේ,
(1) ස්පර්ශ කෘමි නාශකයක් ඉසීමයි. (2) සබන් දියර ඉසීමයි.
(3) සංස්ථානික කෘමි නාශකයක් ඉසීමයි. (4) දිමි ගොටු දැමීමයි.

**33.** පහත සඳහන් ආහාර කාණ්ඩ අතරින් වැඩිපුර ම විටමින් A අඩංගු වන්නේ,
(1) නෙල්ලි, දොඩම්, පැපොල් හා අඹවල ය.
(2) තක්කාලි, මුං, සෝයා හා කුරක්කන්වල ය.
(3) රටකජු, නිවුඩු සහල්, අන්නාසි හා මාළු අක්මාවල ය.
(4) කැරට්, පැපොල්, බිත්තර කහ මද හා පලා වර්ගවල ය.

**34.** මුදවන ලද කිරි නිෂ්පාදනයේ පියවර නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇත්තේ කුමන පිළිතුරෙහි ද?
(1) පෙරීම ⟶ පැස්ටරීකරණය ⟶ මුහුම් දැමීම ⟶ භාජනවලට ඇසිරීම ⟶ පැසීමට තැබීම
(2) මුහුම් දැමීම ⟶ පෙරීම ⟶ පැස්ටරීකරණය ⟶ භාජනවලට ඇසිරීම ⟶ පැසීමට තැබීම
(3) පැස්ටරීකරණය ⟶ පෙරීම ⟶ භාජනවලට ඇසිරීම ⟶ මුහුම් දැමීම ⟶ පැසීමට තැබීම
(4) පෙරීම ⟶ මුහුම් දැමීම ⟶ පැස්ටරීකරණය ⟶ භාජනවලට ඇසිරීම ⟶ පැසීමට තැබීම

**35.** වගා ක්ෂේත්‍රයකින් අතිරික්ත ජලය ඉවත් කිරීම සඳහා යොදා ගනු ලබන කාණු පද්ධතියක් රූපයේ දැක්වේ. එම කාණු පද්ධතිය හඳුන්වන්නේ,



(1) ග්රිඩ් අයන් ලෙස ය.
(2) සමාන්තර ලෙස ය.
(3) හෙරිං බෝන් ලෙස ය.
(4) කොඩොල් කාණු ලෙස ය.

**36.** A, B, C, D වශයෙන් නම් කර ඇති පස් සාම්පල හතරක කැටායන හුවමාරු ධාරිතා පිළිවෙළින් පස් ග්‍රෑම් 100 ට මිලි සමක 20, 24, 30, 35 වේ. මෙයින් වඩාත් ම සාරවත් පස් සාම්පලය නම්,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**37.** පැපොල් අස්වනු නෙළීමට වඩාත් ම සුදුසු අවස්ථාව වන්නේ,
(1) පොත්තේ පැහැය කොළ පැහැයේ සිට කහ පැහැයට හැරෙන අවස්ථාව ය.
(2) පොත්තේ දිලිසෙන ස්වභාවයක් ඇති වන අවස්ථාව ය.
(3) පොත්තේ තැනින් තැන පිපිරුණු ස්වභාවයක් ඇති වන අවස්ථාව ය.
(4) ගෙඩියේ නටුව අසල ප්‍රදේශය කොළ පැහැයේ සිට කහ පැහැයට හැරෙන අවස්ථාව ය.

**38.** මවගෙන් වෙන් කර, ඇති කරනු ලබන ගව පැටවකුට කිරි ලබාදිය යුත්තේ පැටවාගේ ජීව බරින්,
(1) 6% කි. (2) 10% කි. (3) 15% කි. (4) 18% කි.

**39.** ඝන ආස්තරණ ක්‍රමයට කුකුළන් ඇති කිරීමේ දී යොදා ගනු ලබන අතුරණුවක තිබිය යුතු ලක්ෂණ වනුයේ,
(1) දූවිලි ආකාරයෙන් තිබීම හා තෙතමනය උරා ගැනීම ය.
(2) විශාල කොටස් ලෙස තිබීම හා තියුණු දාරවලින් යුක්ත වීම ය.
(3) කුඩා කොටස් ලෙස තිබීම හා කුකුළන්ගේ ආහාරයක් නොවීම ය.
(4) කුඩා කොටස් ලෙස තිබීම හා කුකුළන්ගේ ආහාරයක් වීම ය.

**40.** ශිෂ්‍යයෙක් වෙළෙඳපොළෙන් කිරි පැකට්ටුවක් මිල දී ගත්තේ ය. එහි ලේබලය මත UHT යනුවෙන් ද, විවෘත කළ පසු ශීතකරණයක තබන ලෙස ද සඳහන් ව තිබුණි. මෙහි අඩංගුව තිබෙන්නට ඇත්තේ,
(1) පැස්ටරීකරණය කළ කිරි ය. (2) ජීවාණුහරණය කළ කිරි ය.
(3) පරිරක්ෂණය නොකළ කිරි ය. (4) මේද ඉවත් කළ කිරි ය.

* *

[පස්වැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**81 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය I, II
விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் I, II
Agriculture and Food Technology I, II

## කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

1. කෘෂි ව්‍යවසායවලින් වැඩි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා භූමියේ තිරසාර පැවැත්ම මෙන් ම සත්ත්ව පාලනය හා බෝග වගා කළමනාකරණ පිළිවෙත් පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වේ.
   (i) බෝග වගාවේ දී මූලික බිම් සකස් කිරීම මගින් අත්වන වාසි **දෙකක්** ලියන්න.
   (ii) (a) 'පාංශු ඛාදනය' යනු කුමක් ද?
   (b) පාංශු සංරක්ෂණය සඳහා යොදාගන්නා කෘෂිකාර්මික ක්‍රම **දෙකක්** ලියන්න.
   (iii) (a) බෝග වගාවේ දී, ජල සම්පාදනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
   (b) බෝග වගාවේ දී යොදාගනු ලබන භූතල ජල සම්පාදන ක්‍රම **දෙකක්** නම් කරන්න.
   (iv) පාංශු ජලය සංරක්ෂණය කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **දෙකක්** ලියන්න.
   (v) (a) බීජ ප්‍රරෝහණය සඳහා අවශ්‍ය සාධක **දෙකක්** සඳහන් කරන්න.
   (b) 'බීජ අක්‍රියතාව' යනු කුමක් ද?
   (vi) (a) කුකබිටේසියේ කුලයේ ඵලවලට බහුලව හානි කරන කෘමි පළිබෝධකයකු නම් කරන්න.
   (b) එම කෘමියාගෙන් ඉහත ඵලවලට සිදුවන හානිය පැහැදිලි කරන්න.
   (vii) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ඇති කිරීමට නිර්දේශිත කිරිගව වර්ග **දෙකක්** නම් කරන්න.
   (viii) ක්ෂුද්‍රජීවීන් භාවිත කර නිපදවනු ලබන කිරි ආහාර වර්ග **දෙකක්** නම් කරන්න.
   (ix) (a) බැක්ටීරියා මගින් කුකුළන්ට බහුළ ව වැළඳෙන රෝගයක් නම් කරන්න.
   (b) එම රෝගයේ ලක්ෂණ **දෙකක්** ලියන්න.
   (x) (a) ඝන ආස්තරණ ක්‍රමයට කුකුළන් ඇති කිරීමෙන් ලැබෙන වාසි **දෙකක්** ලියන්න.
   (b) ප්‍රෝටීන් සැපයීම සඳහා කුකුළු ආහාර සලාකයකට එකතු කළ හැකි ආහාර ද්‍රව්‍ය **දෙකක්** ලියන්න.

2. බීජවලින් හැර ශාකයේ අනෙකුත් කොටස්වලින් නව ශාක බිහිකර ගැනීම වර්ධක ප්‍රචාරණයයි.
   (i) වර්ධක ප්‍රචාරණයේ වාසි **හතරක්** ලියන්න.
   (ii) බද්ධ කිරීම සඳහා යොදාගන්නා ග්‍රාහක ශාකයක තිබිය යුතු ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.
   (iii) අඹ පැළයකට කුසද්ද බද්ධය සිදු කරන ආකාරය නම් කරන ලද රූප සටහන් ඇසුරෙන් විස්තර කරන්න.
   (iv) දඬු කැබලිවල මුල් ඇදීම උත්තේජනය කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය **දෙකක්** සඳහන් කරන්න.

3. සාර්ථක බෝග වගාවක් සඳහා වල්පැළෑටි පාලනය ඉතා අත්‍යවශ්‍ය වේ.
   (i) (a) වල්පැළෑටිවල පොදු ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
   (b) වල්පැළෑටිවලින් බෝග වගාවට සිදු වන හානි **හතරක්** ලියන්න.
   (ii) ඒකාබද්ධ වල්පැළෑටි පාලනයේ වාසි **දෙකක්** ලියන්න.
   (iii) කෙටියෙන් පැහැදිලි කරන්න.
   (a) ආගන්තුක ආක්‍රමණශීලි වල්පැළෑටි
   (b) ස්පර්ශ වල්පැළෑටි නාශක

[හයවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



4. බෝගවලට පොහොර යෙදීමේ දී බොහෝ විට ඒවා පසට යොදන අතර ඇතැම් විට දියර පොහොර වශයෙන් පත්‍රවලට යොදනු ලැබේ.

(i) බෝග වගාවේ දී පසට රසායනික පොහොර යෙදීමේ ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(ii) බෝග වගාවේ දී පසට යොදන රසායනික පොහොරවල කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** ලියන්න.

(iii) (a) 'සෘජු පොහොර' හා 'මිශ්‍ර පොහොර' යනු මොනවා දැයි පැහැදිලි කර ඒවා සඳහා උදාහරණයක් බැගින් දක්වන්න.

(b) ගෘහාශ්‍රිතව සකසාගත හැකි ස්වාභාවික දියර පොහොර වර්ග **දෙකක්** නම් කරන්න.

5. ශාක පෙන්නුම් කරන රෝග ලක්ෂණ අනුව ශාකවලට වැළඳී ඇති රෝග හඳුනාගත හැකි ය.

(i) (a) බෝගවලට වැළඳෙන දිලීර රෝගවල පොදු ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(b) වී වගාවට වැළඳෙන දිලීර රෝග **දෙකක්** නම් කරන්න.

(ii) ශාක රෝග ඇති වීම වළක්වා ගැනීම (නිවාරණය) සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.

(iii) (a) සොලනේසියේ කුලයේ බෝගවලට තවාන් අවස්ථාවේ දී බහුලව වැළඳෙන රෝගයක් නම් කරන්න.

(b) එම රෝගයේ රෝග ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(c) එම රෝගය වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** දක්වන්න.

6. බෝග වගා කිරීමේ දී වැඩි නිෂ්පාදනයක් ලබාගනු පිණිස විවිධ ගොවිතැන් ක්‍රම අනුගමනය කරනු ලැබේ.

(i) (a) 'සමෝධානිත ගොවිතැන' යනු කුමක් ද?

(b) සමෝධානිත ගොවිතැනෙහි වාසි **හතරක්** සඳහන් කරන්න.

(ii) කෘෂි වන වගාවේ වැදගත්කම් **හතරක්** සඳහන් කරන්න.

(iii) (a) පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(b) පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේ දී යොදා ගන්නා ගෘහ වර්ග **දෙකක්** නම් කරන්න.

7. සත්ත්ව පාලනයේ දී මනා කළමනාකරණ ක්‍රමවේද අනුගමනය කිරීමෙන් වැඩි ආර්ථික ලාභ ලබාගත හැකි ය.

(i) (a) ගව පාලනයේ දී 'කෘත්‍රිම සිංචනය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(b) කෘත්‍රිම සිංචනයේ වාසි **හතරක්** සඳහන් කරන්න.

(ii) (a) කුකුළු පාලනයේ දී නුසුදුසු පක්ෂීන් ඉවත් කිරීමෙන් ලැබෙන වාසි **හතරක්** සඳහන් කරන්න.

(b) රැක්කවීම සඳහා තෝරාගත යුතු කුකුළු බිත්තරවල තිබිය යුතු ගුණාංග **හතරක්** සඳහන් කරන්න.

(iii) කුකුළන්ට වැළඳෙන කොක්සිඩියෝසිස් රෝගයේ,

(a) රෝගකාරකයා

(b) රෝග ලක්ෂණ **දෙකක්**

(c) රෝග පාලන ක්‍රම **දෙකක්**

සඳහන් කරන්න.

***

Agaram.lk - Keep your dreams alive !

Agaram.lk - Keep your dreams alive !

agaram.lk